# ආලය විඥානය සඳහා පදනම් වූ මූලබීජ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (ථෙරවාද හා යෝගාචාර විඥානවාදි මූලාශ්‍රය ඇසුරිනි)

**කරපික්කඩ සෝභිත හිමි[1], ගිරාඳුරුකෝට්ටේ සාසනරතන හිමි[2], පාහියංගල කස්සප හිමි[3]**

## හැඳින්වීම

මහායාන බෞද්ධ සම්ප්‍රදායෙහි ශ්‍රේෂ්ඨ දාර්ශනික ගුරුකුලයක් වන යෝගාචාර විඥානවාදය තුළ දැක්වෙන මුඛ්‍ය ඉගැන්වීම වනුයේ විඥප්තිමාත්‍රතාවාදය යි. එය ත්‍රිවිධ පරිණාමයක් ඔස්සේ විග්‍රහ කරන්නා වූ යෝගාචාරීහු එහි දී ආලය විඥානය ප්‍රධාන කොට දක්වා ඇත. යෝගාචාර මූලාශ්‍රය තුළ ආලය විඥානය හැඳින්වීම සඳහා සර්ව බීජක, ආදාන විඥාන, විමල විඥාන, පරමාලය විඥාන, ආශ්‍රය විඥාන, බීජ විඥාන, චිත්ත විඥාන යන පර්යාය පද රාශියක් හමු වේ. 'ආලය විඥානයී යන්න මූලාශ්‍රය තුළ විග්‍රහ වන්නේ, ''සත්වයාගේ පැවැත්මෙහි සම්පූර්ණ වගකීම දරන්නේ මේ ආලය විඥානය යි. දීර්ඝ කාලයක සිට සත්‍වයා විසින් සසරදී රැස් කරන ලද කුශල අකුශල කර්මයන් දරා සිටින්නා ද ආලය විඥානය යි. නැති ලෝකයක් ඇති ඇති ලෙස විකෘති අවබෝධයක් ලබාදෙන්නා ද ආලය විඥානය යි. ආලය විඥානය තුළ රැඳී ඇති කර්ම බීජයන් නිසා ආලය විඥානයේ පැවැත්ම සිදුවන අතර, ආලය විඥානය නිසා කර්ම බීජ ආරක්‍ෂා වෙයි. ආලය විඥානය හා කර්ම බීජ යන දෙක අන්‍යෝන්‍ය සහයෝගයෙන් පවතී. ගලන දිය පහරක දිය සේ විච්ඡේදයක් දැක්විය නොහැකි ලෙස ඇතිවෙමින් ද නැතිවෙමින් ද අර්හත්‍වය තෙක් අවිච්ඡින්නව පවතී. සත්‍වයාගේ මරණින් පසු දෙවන භවයෙහි ප්‍රතිසන්‍ධිය ලබන තුරු ගාන්‍ධර්ව ස්වරූපයෙන් පවතී.' (ඤාණසීහ ස්ථවිර, 1964:73) යනුවෙනි.

මෙසේ යෝගාචාරීහු දක්වන ආලය විඥාන සංකල්පය හා සමාන ඉගැන්වීම් රාශියක් ථෙරවාද මූලාශ්‍රය තුළ බෙහෙවින් දැකගත හැකි ය. යෝගාචාරීහු එම ඉගැන්වීම් ද ස්ව ආලය විඥාන සංකල්පය සඳහා මූලබීජ කොටගෙන ඇද්දැයි විමසීම මෙම පර්යේෂණයේ අරමුණයි.

යෝගාචාරීහු ආලය විඥාන සංකල්පය සඳහා ථෙරවාද ඉගැන්වීම් මූලබීජකොටගෙන ඇද්ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි.

ශාස්ත්‍රීය ලෝකය තුළ බොහෝ උගතුන් විසින් යෝගාචාර දර්ශනය හා එහි අන්තර්ගත ආලය විඥාන සංකල්පය පිළිබඳ බොහෝ අධ්‍යයනයන් සිදුකොට ඇති

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්‍ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර. karapikkadasobitha@gmail.com

2. කථිකාචාර්ය, බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්‍ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

3. නිබන්ධක උපදේශක, බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්‍ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

නමුත් ආලය විඥාන සංකල්පය සඳහා පදනම් වූ ථෙරවාද මූලබීජ කවරේ දැයි විමසා බැලීම ඉතා අවම මට්ටමක පැවතීම මෙහි පර්යේෂණ හිඩස වන අතර එයම මෙම පර්යේෂණයේ වැදගත්කම වේ.

මෙම පර්යේෂණයේ දී ථෙරවාද සූත්‍රපිටකාගත ඇතැම් සූත්‍ර දේශනා, අටුවා ග්‍රන්ථ හා යෝගාචාර විඥප්තිමාත්‍රතාසිද්ධිවාද මූලග්‍රන්ථය උපයුක්ත කොටගෙන ඇත.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණයේ දී ග්‍රන්ථ සංධාර ක්‍රමවේදය භාවිත කෙරේ. ඒ අනුව ප්‍රාථමික මූලාශ්‍රය, ද්විතීයික මූලාශ්‍රය, සඟරා හා කෝෂ ග්‍රන්ථ පරිශීලනය තුළින් දත්ත රැස්කිරීම සිදුකොට ඇත.

**සාකච්ඡාව**

යෝගාචාර විඥානවාදයෙහි මුඛ්‍ය ඉගැන්වීමක් ලෙස දැක්වෙන ආලය විඥාන සිද්ධාන්තය ආකස්මික නිර්මාණයක් හෝ යෝගාචාරීන්ගේ ස්ව නිර්මාණයක් ලෙස සිතිය නොහැකි ය. ඔවුහු මූලික බුදුසමයෙහි වූ නිප්පරියාය දේශනා රැගෙන, එහි දැක්වෙන ''ආලය'' යන පදයෙහි භාවිතය දාර්ශනිකව විග්‍රහ කරමින් විඥානවාදී අදහසක් දක්වා පෝෂණය කොට ඇතැයි සිතිය හැකි ය. මෙසේ යෝගාචාරීන්ගේ ආලය විඥාන සංකල්පය සඳහා මූලබීජ වන්නට ඇතැයි සිතිය හැකි සූත්‍ර දේශනාවන් රාශියක් ථෙරවාද ත්‍රිපිටකය තුළ හමු වේ.

ම.නි. අරියපරියේසන සූත්‍රයෙහි බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසු තමා අවබෝධ කොටගත් ගැඹුරු ධර්මය දේශනා කිරීමට මැලි බවක් දක්වා ඇති අයුරු සඳහන් වේ. එයට හේතුව ලෙස දක්වා ඇත්තේ පඤ්චකාම ගුණය රමණය කරන, ආලයන්හි යෙදුණු සත්ත්වයන්ට ගැඹුරු ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය අවබෝධ කිරීමට අපහසු බැවිනි.

තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි අධිගතො ඛො මායං ධම්මො ගම්භීරො දුද්දසො දුරනුබෝධො සන්තො පණීතො අතක්කාවචරො නිපුණො පණ්ඩිත වේදනීයො ආලයරාමා ඛො පනායං පජාය ආලයරතාය ආලයසමුදිතාය දුද්දසං ඉදං ඨානං යදිදං ඉධප්පච්චයතා පටිච්චසමුප්පාදො (ම.නි. i අරියපරියෙසන සූත්‍රය, 2005, 408-409).

මෙහි දී පඤ්චකාමගුණයෙහි ඇලීම, ඉන් රමණය වීම යන අර්ථය ප්‍රකාශ කිරීම සඳහා "ආලය" යන්න භාවිත කොට ඇති අයුරු දක්නට ඇත. එසේ ම සං.නි. ආයාචනා සූත්‍රයෙහි ද පඤ්චකාම ගුණයන්හි ඇලීම, ඉන් සංතෘප්තියට පැමිණීම "ආලය" යන්න තුළින් විග්‍රහ කොට ඇත.

ආලයරාමා ඛො පනායං පජා ආලයරතා ආලයසමුදිතා ආලයරාමාය ඛො පන පජාය ආලයරතාය ආලයසමුදිතාය දුද්දසං ඉදං ඨානං යදිදං ඉදප්පච්චයතා පටිච්චසමුප්පාදො (සං.නි. i ආයාචනා සූත්‍රය, 2005, 248-249).

එසේ ම ම.නි. චූලසීහනාද සූත්‍රය තුළ ද ආලය යන පදය තුළින් භව සහ විභව යන දෘෂ්ඨීන්ගේ ඇලීම හෙවත් උපාදානය සංකේතවත් කොට ඇත. එහි දී යමෙක් උක්ත දෘෂ්ඨීන්ගේ සමුදයත්, අස්තන්ගමයත්, ආස්වාදයත්, ආදීනවයත් තතු සේ නොදනී නම් සසරින් නොමිදෙන බව දක්වා ඇත.

ද්වෙ මෙ භික්ඛවෙ දිට්ඨියො භවදිට්ඨි ච විභවදිට්ඨි ච යෙ කෙ භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා භවදිට්ඨිං අල්ලීනා භවදිට්ඨිං උපාගතා භවදිට්ඨිං අජ්ඣොසිතා විභවදිට්ඨිං උපාගතා විභව දිට්ඨිං අජ්ඣොසිතා භවදිට්ඨියා තෙ පටිවිරුද්ධා...(ම.නි. චූලසීහනාද සූත්‍රය, 2005, 158-159).

''ආලය'' යන පදයෙහි විරුද්ධාර්ථය ''අනාලය'' යන්නයි. ආදී බුදුදහමේ ''අනාලය'' යන පදය යෙදී ඇති අවස්ථා තුළ ද අර්ථවත් වී ඇත්තේ ඇලීම හෙවත් ක්ලේශ ග්‍රහණයන්ගෙන් විනිර්මුක්ත වීමයි. සං.නි. ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ දුක්ඛනිරෝධ සත්‍යය විස්තර කිරීමේ දී කාම, භව, විභව යන තෘෂ්ණාවන්හි නො ඇලීම "අනාලය" යන්නෙන් විස්තර කොට ඇත.

ඉදං ඛො පන භික්ඛවේ දුක්ඛ නිරොධං අරියසච්චං යො තස්සායෙව තණ්හාය අසෙස විරාග නිරෝධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො (සං.නි. සඩ ධම්මචක්කපවත්තන සූත්‍රය, 2005, 270- 271).

සං.නි. සම්මාදිට්ඨි සූත්‍රයේ "අනාලය" යන්න තෘෂ්ණාවන්හි නොඇලීම සඳහාත් සං.නි. අනාලය සූත්‍රයේ එය "කාමය තුළ නො ඇලීම" යන්න සඳහාත් භාවිත කොට තිබේ.

මීට අමතර ව මෙම පදය සං.නි. භාර සූත්‍රයෙහි ද, ජාතකට්ඨකතාවෙහි ද, අභිධර්ම පිටකයෙහි විභංග මූලටීකාවෙහි ද හමුවන අතර, එම සියලු අවස්ථාවන්හි ''තෘෂ්ණාවෙන් මිදීම'' යන අදහස අර්ථවත් කොට ඇත.

මහාවිහාරික ආභිධම්මික සම්ප්‍රදාය විසින් ආලය යන්න ඥාන විභාගාත්මක පදනමකින් සළකා බැලූ අයුරු සංයුත්තනිකායට්ඨකතාවෙන් පැහැදිලි වේ. සංයුත්තනිකායට්ඨකථාවෙහි ''ලී'' නම් ඇලීමේ ධාතුවට ''ආ'' උපසර්ගය එකතුවීමෙන් ''ආලය'' යන්න නිෂ්පන්න වූ බව සඳහන් කරයි. ''ආලයාරාමාති පංචකාම ගුණෙසු අල්ලීයන්ති'' (උදද්රා ගෙක. (සංයුත්තනිකායට්ඨකථාව සංස්.) 1 වෙළුම. 195-196.) අංගුත්තරනිකායට්ඨකතාව හෙවත් මනෝරථපූරණියෙහි ද "ආලය" යන්නෙන් පඤ්චකාම ගුණයන් අදහස් කොට තිබේ. ''අල්ලයීතබ්බට්ඨෙන ආලයොති පඤ්චකාම ගුණා'' (Wallser. M. හා Kopp.H. මනෝරථපූරණිය (අංගුත්තර නිකායට්ඨකතා සංස්) 111 වෙළුම 12.) එසේ ම සුත්තනිපාතට්ඨකථාව "ආලය" යන්න තණ්හා, දිට්ඨි වශයෙන් බෙදා දක්වා ඇත. මෙසේ ථේරීය අට්ඨකථා යුගයෙහි ''ආලය'' යන සූත්‍රාගත පාරිභාෂික පදය ඥානවිභාගාත්මක පදනමකින් විග්‍රහ කොට ඇති අයුරු දක්නට ඇත. ඒ තුළින් ඔවුන් අර්ථවත් කොට ඇත්තේ පඤ්චකාම ගුණයන්හි ඇලීම යි.

එසේ ම යෝගාචාරීහු දක්වන ආලය විඥාන ක්‍රියාවලියට සමාන වූ ඉන්වීමක් ම.නි. මධුපිණ්ඩික සූත්‍රයේ දැක් වේ.

චක්ඛුඤ්චාවුසො පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සංගති ඵස්සො. ඵස්ස පච්චයා වෙදනා. යං වෙදෙති තං සංජානාති. යං සංජානාති තං විතක්කෙති. යං විතක්කෙති තං පපඤ්චෙති. තතො නිදානං පුරිසො පපංඤ්ච සඤ්ඤා සංඛා සමුදාචරන්ති අතීතානාගත පච්චුප්පන්නෙසු චක්ඛු විඤ්ඤෙය්‍යයෙසු රූපෙසු. (ම.නි. ස මධුපිණ්ඩික සුත්ත, 77).

මෙහි විග්‍රහ වන්නා වූ ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලිය තුළ, ඉන්ද්‍රිය, අරමුණ හා මානසික අවධානය යන අවස්ථාවන් එකතුවෙන් නිර්මාණය වන්නා වූ ඵස්සය ද (තිණ්ණං සංගති ඵස්සො), එයින් පසු ඇතිවන්නා වූ වේදනාව ද (ඵස්ස පච්චයා වේදනා), සංජානනය ද (යං වෙදෙති තං සංජානාති), විතර්කය ද (යං සංජානාති තං විතක්කෙති) යන ධර්මතාවන්ගෙන් අනතුරුව වන්නා වූ ප්‍රපඤ්චකරණය (යං විතක්කෙති තං පපඤ්චෙති) තුළ බාහිර ලෝකය පිළිබඳ සාවද්‍ය වූ ආකල්පයක් පුද්ගල සන්තානයෙහි නිර්මාණය වේ. ඒ සඳහා පුද්ගල අභ්‍යන්තර ක්ලේශ ධර්මයන්ගේ ක්‍රියාකාරිත්වය පදනම් වන අතර, ප්‍රපඤ්චකරණය තුළින් ඔහු ලැබූ සාවද්‍ය වූ ප්‍රත්‍යක්ෂය ද මනස තුළ තැන්පත් වේ. මෙම මූලික සූත්‍රාගත විවරණය යෝගාචාර ආලය විඥාන ක්‍රියාවලිය හා බොහෝ සෙයින් සමාන වූවකි.

**නිගමනය**

යෝගාචාර ආලය විඥාන විග්‍රහය සඳහා උක්ත ථෙරවාද මූලාශ්‍රයගත ඉගැන්වීම් මූලබීජ වී ඇති අතර, ඔවුහු එය තවදුරටත් දාර්ශනික වශයෙන් සංවර්ධනයට ලක්කොට ඇත.

**මුඛ්‍ය පද:** ආලය, ථෙරවාද, යෝගාචාර, විඥානය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*සූත්‍ර පිටකය*, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, (බු:ව:,2550), නැදිමාල, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*විඥප්තිමාත්‍රතාසිද්ධිවාදය*, වසුබන්ධු, (විංශතිකා), ස්ථිරමති (ත්‍රිංශතිකා). (1964) අනුවාදක ඥානසීහ හිමි, හේන්පිටගෙදර. කොළඹ: ඇම්. ඩී. ගුණසේන,

*විශුද්ධිමාර්ගය*. (1928). (සංස්.) ධම්මානන්ද, ඇම්. කොළඹ: මහාබෝධි මුද්‍රණාලය.

පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ, (2003). *බෞද්ධ විඥානවාදය*. කොළඹ: ඇස්. ගොඩගේ.

විජේසිංහ, එස්. ඒ. ජී. (2000). *යෝගාචාර විඥානවාදී මහායාන දර්ශනය*. කොළඹ: ඇස්. ගොඩගේ.

විජේසිංහ, එස්. ඒ. ජී. සහ සීලක්ඛන්ධ හිමි, වැවගෙදර, (2009). *බෞද්ධ දර්ශනයේ පශ්චාත් සංවර්ධනය. මූලාශ්‍රය විවරණයකි*. කොළඹ: සමයවර්ධන.